# ඉඩම් අමාත්‍යාංශය

காணி அமைச்சு

**Ministry of Lands**

"මිහිකත මැදුර",
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

"மிஹிகத்தமெதுர",
காணிச் செயலகம்
1200/6, இராஜமல்வத்தை வீதி,
பத்தரமுல்லை.

"MihikathaMedura",
Land Secretariat,
1200/6, RajamalwatteAvenue,
Battaramulla.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. — චක්‍රලේඛ 2008/1(1) | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date — 2020.11. 11. |

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

**<u>රජයේ ඉඩම් මැනීම සඳහා යැවෙන ඉල්ලීම් ක්‍රමානුකූල කිරීම</u>**

ඉහත කරුණ සම්බන්ධව මා විසින් නිකුත් කළ මගේ අංක LD 4/1 අමා - චක්‍රලේඛ 2008/1 කෙරෙහි ඔබගේ අවධානය යොමුකරමි.

එම චක්‍රලේඛයේ 6 වන ඡේදය අවසානයට පහත උපදෙස් ඇතුලත් කරමින් මෙයින් සංශෝධනය කරමි.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අවසර පත්‍රයක් මත බැහැර කර ඇති ඉඩම් සඳහා කඩිනමින් දීමනා පත්‍ර ලබාදීම, එම ඉඩම් ලාභී ජනතාවගේ අයිතිවාසිකම් හා එම ඉඩම් සංවර්ධනය කිරීමේ අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම කෙරෙහි බෙහෙවින් බලපානු ලැබේ. එසේම දැනට ඉදිරිපත් වන මහජන ඉල්ලීම් වලින් වැඩි ප්‍රමාණයක් ඇත්තේ තම ඉඩමට දීමනා පත්‍රයක් ලබාගැනීමේ අවශ්‍යතාවයයි. දීමනා පත්‍ර සකස් කිරීමට අවශ්‍ය රේඛා චිත්‍ර හා ඊට අදාල පිඹුරු වල කැබලි විස්තර ලැයිස්තු සංශෝධනය සඳහා කාලයක් ගතවේ. එම කාලය අවම කර ගැනීම සඳහා දීමනාපත්‍රවලට අදාල රේඛා චිත්‍ර සපයා ගැනීම හා කැබලි විස්තර ලැයිස්තු සංශෝධනය සම්බන්ධව පහත සඳහන් පරිදි ක්‍රියා කරන ලෙස මෙයින් උපදෙස් දෙමි.

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අවසර පත්‍ර මත බැහැර කර ඇති ඉඩම් සඳහා රේඛා චිත්‍ර සකස් කරගැනීම**

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අවසර පත්‍ර මත බැහැර කර ඇති ඉඩමක් සඳහා මැනුම්පතිවරයා විසින් පිඹුරක් සකස් කර එහි සහතික කළ පිටපත ඔබ වෙත ලැබී ඇත්නම් මින් ඉදිරියට එම සහතික කළ පිටපතෙන් **<u>පැහැදිලි හා පරිමාණය වෙනස් නොකල</u>** ඡායා පිටපතක් ලබාගෙන එම ඡායා පිටපත සත්‍ය පිටපතක් බව සහතික කර අදාල ඉඩමේ සතර මායිම් රත් පැහැයෙන් සළකුණු කොට රේඛා චිත්‍රයක් පිළියෙල කර ගත යුතුය.

එම රේඛා චිත්‍රය සත්‍ය පිටපතක් බවට සහතික කිරීමේදී රේඛා චිත්‍රය මත පහත පරිදි රබර් මුද්‍රාවක් සකස් කර සටහන් තබා සහතික කිරීම කළ යුතුය.

## රබර් මුද්‍රාවේ අන්තර්ගතය

<table><tr><td>
සත්‍ය ඡායා සහතික පිටපතක් බව සහතික කරමි<br><br>
කැබලි අංකය .......... ඉඩමේ ප්‍රමාණය ..........<br><br>
සකස් කලේ ....... පරීක්ෂා කලේ ......<br><br>
..........................................<br>
ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්<br>
දිනය : ............
</td></tr></table>

ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් සහතික කළ පිඹුරේ කැබලි විස්තර ලැයිස්තුව පරීක්ෂා කර ඉඩමේ නිවැරදි කැබලි අංකය සහ එහි ප්‍රමාණයන් හඳුනාගෙන එය මෙම රබර් මුද්‍රව මත ඇති හිස්තැන්වල සටහන් කර එය සකස් කළ හා පරීක්ෂා කළ නිළධාරින්ගේ අත්සන් ලබාගෙන ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් පුද්ගලිකව එම රේඛා චිත්‍රය සත්‍ය පිටපතක් බවට සහතික කළයුතුය. <u>**ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම් හැර වෙනත් නිලධාරීන් එය සහතික නොකළ යුතුය.**</u>

## කැබලි විස්තර ලැයිස්තුව සංශෝධනය

ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් සකස් කොට සහතික කර ඔබ වෙත එවා ඇති මැනුම් පිඹුරු වල කැබලි විස්තර ලැයිස්තුවේ ඉඩමේ හිමිකරු සම්බන්ධ විස්තර වරින් වර සංශෝධනය කිරීමට සිදුවේ. ඊට හේතුව බලපත්‍ර කරු වෙනස්වීම හේතුවෙන් අයිතිය මාරු කිරීම වැනි හේතු මත බලපත්‍ර අයිතිය නිතර සංශෝධන වීමයි. මෙවැනි අවස්ථාවකදී දීමනා පත්‍ර පිළියෙල කිරීමට පෙර කැබලි විස්තර ලැයිස්තු සංශෝධනය සඳහා විශාල වශයෙන් ඉල්ලීම් දිස්ත්‍රික් මැනුම් කාර්යාල වෙත ලැබෙමින් පවතී. ප්‍රමාණවත් තොරතුරු නොමැති අවස්ථාවල එම ඉඩම් පරීක්ෂා කිරීම සඳහා මැනුම් නිලධාරීන් යොදවන බවද පෙනේ. මේ මගින් රජයේ ඉඩම් මැනුම් කිරීමට ඇති කාලයද අපතේ යයි. එබැවින් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් සහතික කර ඔබ වෙත එවා ඇති පිඹුරක කැබලි විස්තර ලැයිස්තුව සංශෝධනය කළ යුතු අවස්ථාවක පහත පරිදි ක්‍රියා කළයුතුවේ.

I. සංශෝධනය කිරීමට නියමිත ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදා දී ඇති ඉඩම් කැබැල්ල පිඹුරේ නිවැරදිව හඳුනාගෙන කැබලි විස්තර ලැයිස්තුවේ එම කැබැල්ලට අදාල වෙනත් විස්තර තීරයේ බලපත්‍ර කරුගේ නම හා ලිපිනය ඇතුලත් කොට සංශෝධනය කිරීම තහවුරු කරගෙන ඉඩම් විස්තර ලැයිස්තුවේ කලින් දක්වා ඇති සටහන රතු ඉරකින් කපා හැර ඊට ඉහළින් ඉඩ ඇති පරිදි නව බලපත්‍ර කරුගේ නම හා ලිපිනය හා බලපත්‍ර අංකය (වෙනස්ව ඇත්නම්) එයද සංශෝධනය කරමින් සටහනක් තැබිය යුතුය. <u>එම සටහන ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් පමණක් සහතික කර අත්සන් කළ යුතුය. එම අත්සනට පහළින් ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්ගේ නිල මුද්‍රාව තැබිය යුතුය.</u>

II. එසේ සංශෝධනය කිරීමෙන් පසු නොපමාව එම තොරතුරු L/96 ආකෘතියක සටහන් කර අදාල දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී වෙත යැවිය යුතුය. මේ පිළිබඳ මගේ 2008/1 චක්‍ර ලේඛයේ 5.4 ඡේදයටද ඔබගේ අවධානය යොමු කළ යුතුය.

III. ඉහත පරිදි රේඛා චිත්‍ර පිළියෙල කර ගැනීම හා කැබලි විස්තර ලැයිස්තු සංශෝධනය ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බැහැර කරන ලද බලපත්‍රයක් සහිතව බෙදා දී ඇති ඉඩම්වලට අදාල බිම් කැබලි වලට පමණක් සීමා වන බව සැලකිය යුතුය.

මෙම විධිවිධානය සකසා ඇත්තේ මහජනතාවට තම ඉඩම්වල අදාල දීමනා පත්‍ර ලබාගැනීමේ කටයුතු කඩිනමින් තොරව ලබාගැනීමේ අවශ්‍යතාව සපුරා ගැනීම පෙරදැරි කරගෙනය. එබැවින් ප්‍රාදේශීය ලේකම්වරුන් ඒ පිළිබඳ තම දැඩි අවධානය යොමුකළ යුතු බවට උපදෙස් දෙමි. එසේම මේ මගින් වෙනත් වංචා හෝ අකටයුතු සිදුවීමට ඇති ඉඩකඩ වලක්වා ගැනීම ඔබගේ වගකීමක් වේ.

**ආර්.ඒ.ඒ.කේ රණවක**
**ලේකම්**
**ඉඩම් අමාත්‍යාංශය.**

පිටපත් : 1. ලේකම්, ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

2. සර්වේයර් ජනරාල් - දැ.ගැ.පි.
3. ඉඩම් කොමසාරිස් ජනරාල් - දැ.ගැ.පි.
4. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් - දැ.ගැ.පි. හා අ.ක.ස
5. සියලුම දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.පි. හා අ.ක.ස
6. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් - දැ.ගැ.පි. හා අ.ක.ස